කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13

2016 ජනවාරි/ පෙබරවාරි

**BMGT E 1025/ BMGT 13025 – ව්‍යාපාර ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.**

**ප්‍රශ්න අංක 01**

අ) මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව අනුව මූල්‍ය ප්‍රකාශන වල අඩංගු විය යුතු මූලික ගුණාත්මක ලක්ෂණ සහ අනෙකුත් ගුණාත්මක ලක්ෂණ දෙකක් (02) වෙන් වෙන්ව හඳුනාගන්න.

**(ලකුණු 03)**

ආ) ගිණුම්කරණ සංකල්ප 03 (තුනක්) හඳුනාගෙන ඒවා කෙටියෙන් විස්තර කර, එම එක් එක් ගිණුම්කරණ සංකල්ප මූල්‍ය ප්‍රකාශන වලට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 03)**

ඇ) ABC සමාගමේ 2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා අදාල වන තොරතුරු කිහිපයක් පහතින් දක්වෙන අතර එහිදී කඩ වී ඇති ගුණාත්මක ලක්ෂණ සඳහන් කරන්න.

a) පසුගිය වර්ෂ දෙක ඇතුලත දී සමාගම තම තොග සම්බන්ධ ප්‍රතිපත්තිය තෙවරක් වෙනස් කර ඇත.

b) සමාගම අනුගමනය කරනු ලබන තොග සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය කර්මාන්තයේ තොග ප්‍රතිපත්තියට අනුකූල වන්නේ නැත.

c) තෙවන කාර්තුව අවසන් වී ඇතත් සමාගම තවමත් මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කර නොමැත.

**(ලකුණු 03)**

ඈ) XY සමාගමේ නවක ගිණුම් ලිපිකරුගේ මතයන් කීපයක් පහත ප්‍රකාශ වලින් දක් වේ.

a) සමාගමේ අයිතිකරු තමාගේ පරිහරණය සඳහා පරිගණකයක් මිලදී ගෙන ඇත. මේ සඳහා වන ගෙවීම සමාගමේ බැංකු ගිණුම හරහා සිදු වී ඇති බැවින් මෙම පරිගණකය කාර්යාල උපකරණ ගිණුමේ වාර්තාකල යුතු බව ඔහුගේ මතයයි.

b) සමාගමේ නෂ්ට වූ තොග අයිතමවල වටිනාකම රු. 10,000 වන අතර එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 25,000 වේ. ලිපිකරුගේ මතය වන්නේ මෙම තොග වලට අදාල විකුණුම් සිදු වන තෙක් කිසිදු අලාභයක් හඳුනා නොගත යුතු බවයි.

c) සමාගම අවුරුදු 5 කට ඉහතදී රු. 500,000 කට මිලදී ගත් ඉඩමක අද වෙළඳපොල වටිනාකම රු. 750,000 කි. ලිපිකරුගේ මතය වන්නේ සමාගම මෙය ලාභයක් ලෙස හඳුනාගත යුතු බවයි.

සමාගම ඉහත එක් එක් අවස්ථාවන් වලදී ගිණුම් ලිපිකරුගේ මතය ක්‍රියාත්මක කලහොත් එහිදී කඩවන ගිණුම්කරණ සංකල්පය හෝ මූලධර්මය සඳහන් කර, එම එක් එක් අවස්ථාවන් වලදී ගත යුතු නිවැරදි ගිණුම්කරණ ක්‍රියාමාර්ගය ද සඳහන් කරන්න.

**(ලකුණු 06)**

ඉ) සමාගමක ගිණුම්කරණ පද්ධතිය ඇගයීමේ කාර්යය ඔබට ලබා දී ඇති බවත්, එහිදී සමාගමේ දැනට පවතින ගිණුම්කරණ පද්ධතිය සමාගමේ වර්තමාන කටයුතු පවා කරගෙන යාමට ප්‍රමාණවත් නොවන බව ඔබ විසින් අනාවරණය කර ගත් බවත් උපකල්පනය කරන්න. පහත දෑ සම්බන්ධයෙන් සමාගමට උපදෙස් දෙන්න.

(a) සමාගමක ගිණුම්කරණ පද්ධතියකින් සාමාන්‍යයෙන් ආවරණය වන විවිධ පැතිකඩයන්

**(ලකුණු 03)**

(b) සමාගමකට විධිමත් ගිණුම්කරණ පද්ධතිය හඳුන්වා දීමට පෙර සලකා බැලිය යුතු කරුණු.

**(ලකුණු 02)**
**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

සඳකඩ සමාගමේ කණිෂ්ඨ ලිපිකරු විසින් 2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| | රු. හර | රු. බැර |
|---|---|---|
| ඉඩම් | 4,077,000 | - |
| යන්ත්‍ර | 181,260 | - |
| මෝටර් රථ | 370,440 | - |
| ගොඩනැගිලි | 5,100,000 | - |
| ක්ෂය සඳහා වෙන් කිරීම - 1/4/2014 දිනට | | |
| යන්ත්‍ර | | 27,189 |
| මෝටර් රථ | | 74,088 |
| ගොඩනැගිලි | | 2,550,000 |
| ස්වාධිකාරය | 273,600 | |
| විකුණුම් | | 14,535,000 |
| තොග 01/04/2014 දිනට | 525,800 | |
| ගැනුම් | 7,662,760 | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 1,420,860 | |
| සුළු මුදල් ශේෂය | 6,000 | |
| මුදල් | 62,056 | |
| බෙදාහැරීමේ වියදම් | 1,372,860 | |
| පරිපාලන වියදම් | 2,102,640 | |
| අනෙකුත් ආදායම් | 516,000 | |

| | | |
|---|---|---|
| මූල්‍ය පිරිවැය | 1,090,800 | |
| කුලී ආදායම | | 600,000 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (එකක් රු. 10 යේ) | | 2,000,000 |
| රඳවාගත් ලාභය 1/4/2014 දිනට | | 3,733,606 |
| ආයෝජන | 5,120,640 | |
| ආදායම් බදු වෙන්කිරීම 1/4/2014 දිනට | | 144,000 |
| ආදායම් බදු ගෙවීම් | | |
| 2013/2014 තක්සේරු වර්ෂය සඳහා | 135,000 | |
| 2014/2015 තක්සේරු වර්ෂය සඳහා | 63,000 | |
| පොලී සහිත දිගුකාලීන ණය | | 1,628,400 |
| විශ්‍රාම පාරිතෝෂිකය | | 1,950,120 |
| කෙටි කාලීන ණය | | 610,993 |
| ගෙවූ අතුරු ලාභාංශ (ශුද්ධ) | 162,000 | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | | 891,600 |
| බැංකු අයිරාව | | 465,720 |
| **එකතුව** | **30,242,716** | **29,210,716** |

අනෙකුත් තොරතුරු

(i) ජ්‍යෙෂ්ඨ ගිණුම් ලිපිකරු විසින් සමාගමේ ශේෂ පරික්ෂුමේ වෙනසක් ඇති බවත්, එය ශේෂ පිරික්සුමේ සිදුවූ වරදක් බවත්, අනාවරණය කරගන්නා ලදී.

(ii) සමාගම 2014 සැප්තැම්බර් 30 දින සිට ඔවුන් සතු ගොඩනැගිල්ලක් මාසික කුලිය රු. 60,000 කට කුලියට දී ඇත. නමුත් එය 2015 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කුලිය වර්ෂයකට රු. 1,200,000 ලෙස වෙනස් කිරීමට සමාගම තීරණය කර ඇත.

(iii) සමාගම භාණ්ඩ සඳහා අළුත් වැඩියා සඳහා වගකීම් සහතිකයක් ලබා දෙන අතර එය මසකට රු. 5000 ලෙස ඇස්තමේන්තු කර ඇත.

(iv) සමාගමේ ස්වාධිකාරය, එය අත්පත් කරගත් 2013 අප්‍රේල් 01 දින සිට වසර 05 ක කාලයක් සඳහා ක්‍රමක් ක්ෂය කල යුතු නමුත් මේ සඳහා කිසිම ගැලපීමක් සිදුකර නැත.

(v) තොගවල පිරිවැය රු. 440,000 වන අතර එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 480,000 ලෙස ඇස්තමේන්තු කර ඇත.

(vi) වර්ෂය තුලදී සමාගම විසින් 2015 මාර්තු 31 දිනට පැවති සෑම කොටස් පහකට එකක් බැගින් වන සේ, කොටසක් රු. 12 බැගින් වූ අයිතිවාසිකම් නිකුතුවක් කරන ලදී. මේ සඳහා කිසිම ගැලපීමක් සිදුකර නොමැත.

(vii) 2015 අප්‍රේල් 05 දින ඇතිවූ හදිසි ගින්නක් නිසා ව්‍යාපාරයට රු. මිලියන 1.5 අලාභයක් සිදු වී ඇත.

(viii) 2014/2015 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම් බදු වගකීම රු. 180,000 වන අතර 2013/2014 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් බදු වගකීම සම්පූර්ණයෙන්ම ගෙවන ලදී.

(ix) පහත සඳහන් ක්ෂය අනුපාතයන් භාවිතා කරමින් සරල මාර්ග ක්‍රමයට වත්කම් ක්ෂය කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

| | |
|---|---|
| යන්ත්‍ර | 15% |
| මෝටර් රථ | 20% |
| ගොඩනැගිලි | 2.5% |

(x) 2015 මාර්තු 31 දින ඉඩම් රු. මිලියන 4.3 කට ප්‍රත්‍යාගණනය කල අතර එය ගිණුම් පොත්වල වාර්තා කර නොමැත.

(xi) පොලී සහිත දිගුකාලීන ණය 12% ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ වර්ෂය මුලදී ලබාගෙන ඇත. කෙසේ නමුත් මෙම ණයවල ණය ප්‍රාග්ධනය ගෙවීම ආරම්භ කිරීම සඳහා වසර තුනක සහන කාලයක් ලබා දී ඇත.

(xii) ගෙවූ අතුරු ලාභාංශ මත වන 10% යේ රඳවාගැනීමේ බද්ද පොත්වලට ගෙන නොමැත.

(xiii) සමාගමේ අධ්‍යක්ෂකවරුන් පහත තීරණ ගෙන ඇත.

(a) රු. 205,000 ක් පොදු සංචිතයට මාරුකිරීම.

(b) රු. 100,000 ක්, පොදු සංචිතය භාවිතයෙන් ප්‍රාග්ධනිත කිරීම.

අවශ්‍ය වන්නේ, සඳකඩ සමාගමේ ප්‍රසිද්ධ කිරීමට අදාල,

(a) 2015 මාර්තු 31 අවසන් වර්ෂය සඳහා ලාභා/ අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය.

(b) 2015 මාර්තු 31 අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය.

(c) 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශ්‍ය.

**(මුළු ලකුණු 30)**

**ප්‍රශ්න අංක 03**

අ) (a) හවුල් ව්‍යාපාර විසුරුවා හැරීමේදී ශ්‍රී ලංකාවට අදාල හවුල් ව්‍යාපාර නීතියේ 44 වන වගන්තිය අදාල වන්නේ කෙසේද?

**(ලකුණු 03)**

(b) හවුල් ව්‍යාපාර විසුරුවා හැරීමේ ක්‍රියාවලිය තුල "ගානර් එදිරිව මරේ" නඩු තීන්දුව අදාල වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 02)**

(c) හවුල් ව්‍යාපාර කඩින් කඩ විසුරුවා හැරීම යනු කුමක්ද? හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීමේදී හවුල් කරුවන් අතර ප්‍රාග්ධනය බෙදාහැරීමේ දී අනුගමනය කල හැකි ප්‍රධාන ක්‍රම දෙක මොනවාද?

**(ලකුණු 02)**

(d) පහත දැක්වෙන තොරතුරු 2015 මාර්තු 31 අවසන් වර්ෂය සඳහා සරු සමාගමේ පොත් වලින් උපුටා ගෙන ඇත.

| | රුපියල් දහස් | |
|---|---|---|
| | පොත් අගය | වෙළඳපොල අගය |
| මුළු වත්කම් | 120,000 | 150,000 |
| මුළු වගකීම් | 70,000 | 80,000 |

සරු සමාගමේ කීර්තිනාමය වෙනුවෙන් එහි ශුද්ධ වත්කම් වලට වඩා 10% ක මිලක් ගෙවා ඔබ එම සමාගම අත්පත් කරගන්නේ නම්, සරු සමාගම සඳහා ඔබ ගෙවනු ලබන ගැනුම් ප්‍රතිෂ්ටාව කොපමණද?

**(ලකුණු 03)**

ආ) ඒ.බී හා සී හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අතර ඔවුන් ලාභඅලාභ 3:2:1 අනුපාතයට බෙදා ගනී. 2015 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔවුන් හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට තීරණය කරන ලදී. එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත පරිදි වේ.

| | | රු. |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | | 80,000 |
| ලී බඩු හා සවිකිරීම් | | 12,000 |
| යන්ත්‍ර හා උපකරණ | | 30,000 |
| ආයෝජන | | 35,000 |
| තොගය | 18,000 | |
| ණයගැතියෝ | 60,000 | |
| මුදල් | 10,000 | 88,000 |
| | | **245,000** |
| ප්‍රාග්ධන ගිණුම | | |
| ඒ | 60,000 | |
| බී | 40,000 | |
| සී | 25,000 | 125,000 |
| ණයහිමියෝ | | 90,000 |
| බැංකු අයිරාව | | 30,000 |
| | | **245,000** |

ව්‍යාපාරය, වත්කම් උපලබ්ධි කිරීමේ වියදම් අඩුකර ගැනීමෙන් ද පසු, ක්‍රමානුකූලව පහත පරිදි වත්කම් උපලබ්ධි කරගන්නා ලදී.

- පළමු ලැබීම් වාරිකය රු. 75,000 (බැංකු මුදල් ශේෂය ද සමඟ)
- දෙවන ලැබීම් වාරිකය රු. 32,000
- තෙවන ලැබීම් වාරිකය රු. 62,000
- සිව්වන ලැබීම් වාරිකය රු. 43,000
- පස්වන හා අවසාන ලැබීම් වාරිකය රු. 21,000

සෑම උපලබ්ධි ලැබීම් වාරිකයක් අවසානයේ දීම හවුල් කරුවන්ට මුදල් ලබා දෙන්නේ නම්, එක් එක් වාරික ලැබීම්වලදී, හවුල්කරුවන් අතර ඒවා බෙදී යන ආකාරය දක්වන්න.

**(ලකුණු 10)**
**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

(අ) දේශීය වශයෙන් සපත්තු නිෂ්පාදනය කර බෙදාහරින කුඩා ව්‍යාපාරයක් ශ්‍රී ලක් සතුය. 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රීලක්ගේ ව්‍යාපාරයේ පොත්වලින් උපුටා ගන්නා ලද තොරතුරු පහත පරිදි වේ.

| | (රු.000) |
|---|---:|
| තොගය 01/04/2014 දිනට | |
| අමුද්‍රව්‍ය | 1,500 |
| නොනිමි (ප්‍රාථමික පිරිවැයට) | 8,900 |
| නිමි | 12,500 |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 32,600 |
| සෘජු වේතන | 45,000 |
| ආපසු යැවුම් | |
| අමුද්‍රව්‍ය | 1,800 |
| නිමි | 800 |
| පිටතින් මිලට ගන්නා ලද සපත්තු | 17,200 |
| අනෙකුත් සෘජු වියදම් | 3,000 |
| විකුණුම් | 150,000 |
| නිෂ්පාදන වැටුප් | 600 |
| අනෙකුත් නිෂ්පාදන පොදුකාර්ය | 1,500 |
| අනෙකුත් පරිපාලන පිරිවැය | 610 |
| විදුලිය | 3,000 |
| උපකරණ නඩත්තු | 1,200 |
| මෝටර් රථ ක්ෂය | 15,000 |
| කම්හල් කුලිය | 5,000 |
| බැංකු ගාස්තු | 220 |
| පොදු වියදම් | 1,000 |

අනෙකුත් තොරතුරු.

(i) 2015 මාර්තු 31 දිනට තොගය පහත පරිදි වේ.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | රු. 2,100,000 |
| නොනිමි (ප්‍රාථමික පිරිවැයට) | රු. 10,500,000 |
| නිමි | රු. 8,500,000 |

(ii) 2015 මාර්තු 31 දිනට උපචිත විදුලිය රු. 600,000 වන අතර බැංකු ගාස්තු වලින් 80% අමුද්‍රව්‍ය මිලදී ගැනීමට අදාල වේ.

(iii) වියදම් පහත පරිදි කර්මාන්ත ශාලාවට විභාජනය කල යුතුය.

| | |
|---|---|
| විදුලිය | 80% |
| මෝටර් රථ ක්ෂය | 75% |
| උපකරණ නඩත්තු | 50% |
| පොදු වියදම් | 60% |

අවශ්‍ය වන්නේ,

(a) 2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ශ්‍රීලක්ගේ ව්‍යාපාරයේ, නිෂ්පාදන ගිණුම

(b) 2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ශ්‍රීලක්ගේ ව්‍යාපාරයේ, වෙළඳ ගිණුම **(ලකුණු 10)**

(ආ) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එල්.එෆ්.බී. (LFB) ව්‍යාපාරයේ පහත තොරතුරු සපයා ඇත.

2015 මාර්තු 31 අවසන් වර්ෂය සඳහා ලාභ හා අලාභ ප්‍රකාශනය

| **වර්ෂය** | **2015** | **2014** |
|---|---|---|
| විකුණුම් | 8,075,667 | 9,500,785 |
| විකුණුම් පිරිවැය | (4,211,440) | (3,452,000) |
| **දළ ලාභය** | **3,864,227** | **6,048,785** |
| බෙදාහැරීමේ වියදම් | (2,912,731) | (2,886,368) |
| පරිපාලන වියදම් | (1,434,896) | - |
| මූල්‍ය වියදම් (ශුද්ධ) | (696,000) | (580,000) |
| අනෙකුත් වියදම් | - | (350,000) |
| බදු පෙර ලාභය | **(1,179,400)** | **2,232,417** |
| **බදු** | - | (100,000) |
| වර්ෂයේ ලාභය | **(1,179,400)** | **2,132,417** |

2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| **වර්ෂය** | **2015** | **2014** |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල, පිරියත හා උපකරණ | 565,735 | 834,700 |
| කල්බදු වත්කම් | 118,905 | 163,112 |
| විලම්භිත බදු වත්කම් | 5,873 | 18,845 |
| | **690,513** | **1,016,657** |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 337,867 | 407,187 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 792,736 | 799,960 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 19,364 | 219,979 |
| මුළු ජංගම වත්කම් | **1,149,967** | **1,427,126** |
| **මුළු වත්කම්** | **1,840,480** | **2,443,783** |
| | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (එකක් රු. 10 යේ) | 1,120,470 | 710,470 |
| රඳවාගත් ලාභය | (2,711,817) | 600,000 |
| **මුළු හිමිකම** | **(1,591,347)** | **1,310,470** |
| | | |
| **ජංගම නොවන වගකීම්** | | |
| පොලී සහිත දිගුකාලීන ණය | 1,061,844 | 151,692 |
| විශ්‍රාම පාරිතෝෂිකය | 465,348 | 7,877 |
| විලම්භිත බදු වගකීම් | 600,000 | 42,980 |
| | **2,127,192** | **202,549** |

| | | |
|---|---|---|
| **ජංගම වගකීම්** | | |
| දිගුකාලීන ණය-කෙටි කාලීන කොටස | 468,000 | 101,000 |
| පොලී සහිත කෙටිකාලීන ණය | 356,136 | 373,010 |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 246,226 | 336,174 |
| ආදායම් බදු වගකීම් | 108,829 | 14,590 |
| බැංකු අයිරාව | 125,444 | 105,990 |
| | **1,304,635** | **930,764** |
| **මුළු වගකීම්** | 3,431,827 | 1,133,313 |
| **මුළු හිමිකම හා වගකීම්** | **1,840,480** | **2,443,783** |

**අවශ්‍ය වන්නේ,**

සමාගමේ මූල්‍ය උපදේශක ලෙස ඔබ පත්කර ඇති බවට උපකල්පනය කරමින්,

(a) පහත එක් එක් පැතිකඩයන් නිරීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන මූල්‍ය අනුපාත දෙක (02) බැගින් ගණනය කිරීම.
සමාගමේ,
- (i) ලාභදායිත්වය
- (ii) ද්‍රවශීලතාවය සහ
- (iii) කාර්යක්ෂමතාවය

**(ලකුණු 06)**

(b) ඔබේ නිරීක්ෂණ පිළිබඳ කෙටියෙන් අදහස් දක්වන්න.

**(ලකුණු 02)**

(c) සමාගමක අනුපාත විශ්ලේෂණයේ ඇති දුර්වලතා මොනවාද?

**(ලකුණු 02)**
**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

(අ) පහත සඳහන් යෙදීම් කෙටියෙන් පැහැදිලි කරන්න.
- (i) අවම සහභාගය
- (ii) මහා පරිමාණ ප්‍රාග්ධන අලාභ
- (iii) නුබුන්වත්භාවයේ පරීක්ෂණය (Solvency test)
- (iv) මූලික ප්‍රසිද්ධ නිකුතුව (Initial public offering)
- (v) ගිණුම්කරණ යථාර්ථය

**(ලකුණු 02 x 5 = මුළු ලකුණු 10)**